මාවතගම-පොල්පිතිගම

රාජ්‍ය නිලධාරීන් හා සිවිල් සමාජ සංවිධාන සඳහා යහපාලන පුහුණුව

'දූෂණය තිබීවාම අපි දැනගෙන හිටියේ ස්ත්‍රී දූෂණයයි, අල්ලසයි ගැන විතරයි. ඒත් දූෂණය කියන විෂය මොනතරම් පුළුල් පරාසයකට විහිදෙනවද? එයින් අපේ රටට, සමාජයට මොනතරම් හානි සිදුවෙනවද කියලා මේ වැඩසටහන්වලදි අපට වීතලාල දැනුමක් ලැබුණා. මේ වැඩසටහන් වලින් පස්සේ පුද්ගලයින් විදුහට අපි හිතන විදිලයේ, හීරණ ගන්නා විදිලේ ලොකු වෙනසක් ඇතිවුණා. උදේ 9.00ට ගිහින් 8.30 දාල අත්සන් කරන්න කලින්, ඔරිජි එකක් පසා ගෙදර ගෙනියන්න කලින් දැන් අපි අපි එක්කම යම් සංවාදයකට යනවා. මම ඒ අත්දැකීම මගේ පවුලේ සාමාජිකයින් සමග බෙදා ගන්නා ඊළඟට මා උස්සාහ කරන්නේ මා තුළ ඇතිවූ ඒ වෙනස අනෙක් අය තුළත් ඇතිකරමින් පොදුවේ අප තුළ යම් වෙනසක් ඇතිකරගැනීමටයි.

සමෘද්ධි සංවර්ධන නිලධාරි පියසිරි ජයසිංහ මහතා අදහස් පළකළේ අධීක්ෂධානශීලීවය.

"විශේෂයෙන්ම අපේ ප්‍රාදේශීය ලේකම් රංජිත් ආරච්චිතන්න මහතා වගේම මේ වැඩසටහනට දායකවී සිටින අනෙක් නිලධාරීන්, පුද්ගලයන් වශයෙන් සමාජය තුළ හොඳ පිළිගැනීමක් තියෙන අය. ඒ නිසා අපි එකතුවෙලා හදපු ක්‍රියාකාරී සැලැස්ම මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සාර්ථකව ක්‍රියාවට නංවන්න අපහසුවෙන්නේ නැහැ.

සිවිල් සමාජ සංවිධාන හියෝජනය කරමින් යහපාලන පුහුණු වැඩසටහනට සහභාගී වූ විශාඛලත් විදුහල්පතිවරයකු හා සිවිල් සංවිධාන රැසක ක්‍රියාකාරීකයකු වූ බස්නායක මහතා එසේ පැවසුවේ මාවතගම වෙනසක් ඇති කිරීමට තමන්ටඅපහසු නොවන බව සඳහන් කරමිනි.

'අපි උත්සාහ කරන්නේ ආකල්පමය වෙනසක් තුළින් මේ අත්හදා බැලීම කරන්නයි. සියලු නිලධාරීන් අතර ඉතා හොඳ සම්බන්ධතාවයක් ඇති කර ගැනීම මගින් කෙනෙකුට අයුතු යෝජනාවක් කරන්න තියෙන ඉඩ හුස්වා අහිමි වෙනවා. මහජනතාවට සෘජුව තම අරගතතා ඉටු කර ගැනීම ගැන දැනුමක් ලබා දුන්නාම තව අයෙකු හරහා නිලධාරීයෙකු හමුවෙන්න අවශ්‍ය වෙන්නේ නැහැ' බස්නායක මහතා කීවේය.

මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත රාජ්‍ය නිලධාරීන් හා සිවිල් සමාජ සංවිධාන වල ක්‍රියාකාරකයන් උදෙසා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් සංවිධානය කළ 'යහපාලනය, දූෂණ මර්ධනය හා ශක්තනා ප්‍රවර්ධනය' පුහුණු වැඩසටහන් මාලාව යටතේ පසුගිය මාස කිහිපය තුළ දැනුම්වත් කිරීමේ වැඩසටහන් 10ක් පැවති අතර වැඩිදුර පුහුණුවා ලැබීමට උනන්දුවක් දැක්වූ කෝරාගත් නිලධාරීන් 40දෙනෙකු සඳහා, යහපාලනය හා දූෂණ මර්ධනය, රාජ්‍ය නිලධාරීන් සඳහා ආචාර ධර්ම, පැමිණිලි විමර්ශණය කිරීමේ යාන්ත්‍රණය හා මහජන විගණනය යන විෂයයන් පිළිබඳව වැඩිදුර පුහුණු වැඩසටහනක් වාරයකපොල පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලදි. අනතුරුව මාවතගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ක්‍රියාවට නංවීම සඳහා සිවිල් සමාජ සංවිධාන හා රාජ්‍ය නිලධාරීන් විසින් වෙන වෙනම ක්‍රියාකාරී සැලසුම් සකස්කර, දෙපාර්ශ්වය එක් වී ඒකාබද්ධ සැලසුමක් සම්පාදනය කිරීම පසුගියදා සිදුකරනු ලැබීය.

පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් ආර්.එම්. රත්නායක මහතාගේ පූර්ණ සහාය ඇතිව එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළදී මේම 'යහපාලන' වැඩසටහන ක්‍රියාවට නංවීම ආරම්භ කර ඇති අතර ඒ යටතේ දායකවෙන් පුහුණු වැඩසටහන් 20ක් සම්පූර්ණ කර තිබේ.

වැඩසටහන් සම්බන්ධීකාරක හිතේඥ සඳුන් ගුණවර්ධන, අල්ලස් හෝ දූෂණ වෝදනා විමර්ශණ කොමිසන් සභාවේ හිටපු හියෝජිත අධ්‍යක්ෂ ජෙපරාල් හිතේඥ ඒ. කේ. එන්ද්‍රසාන්න, ශක්තනා ප්‍රවර්ධන අංශයේ අධක්ෂිකා ඊ. කලෙයිමගල්, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා හි හියෝජිත විධායක අධ්‍යක්ෂ රැක්ෂණ නානායක්කාර මෙම වැඩසටහන් මාලාවේ සම්පත් දායකයන් වශයෙන් සහභාගී වූ අතර වැඩිදුර පුහුණු වැඩසටහන් සඳහා හිටපු දිස්ත්‍රික් ලේකම් ජයන්තා ඉඳුමුල්ල, හිතේඥ නිමල් හපුආරච්චි, වයඹ පුහුණු ආයතනයේ හිටපු අධ්‍යක්ෂක ඩබ් එම් එම් ඩී ඊරසේකර, මධ්‍යම පරිසර අධිකාරියේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් මානෙල් ජයමාන්න, ශ්‍රී ලංකා පරිපාලන සංවර්ධන ආයතනයේ හිටපු අදේශක උපදේශක හිතේඥ ඩබ්. ඒ. ඩී. ගුණසිංහ යන මහත්ම මහත්මිකු ද සහභාගී වූහ.

සමෘද්ධි සංවර්ධන නිලධාරි පියසිරි ජයසිංහ මහතා

ප්‍රාදේශීය ලේකම් - මාවතගම රංජිත් ආරච්චිතන්න මහතා

ප්‍රාදේශීය ලේකම් - පොල්පිතිගම ආර්.එම්. රත්නායක මහතා

විශාඛලත් විදුහල්පති බස්නායක මහතා

නිබන්ධන තරගයට අගනා ප්‍රතිචාරයක්

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් සංවිධානය කෙරෙන දූෂණ විරෝධී නිබන්ධන තරගයට අගනා ප්‍රතිචාරයක් ලැබී ඇත. ඊට සහභාගිවීමේ සඳහා විශ්ව විද්‍යාල හා වෙනත් උසස් අධ්‍යාපන ආයතන වල සිසුන් සිය ගණනක් ඉල්ලුම්කළ ද, තරගයේ කොන්දේසි අනුව සුදුසුකම් ලැබුවේ අයදුම්කරුවන් 452 කි. ඒ අය අතුරින් වැඩි දෙනෙක් දෙමළ මාධ්‍යයෙන් තරගයට සහභාගිවීමට ඉල්ලුම් කළ අයවලුන් වීම විශේෂත්වයකි. දෙමළ මාධ්‍යයෙන් 254 දෙනෙක් සුදුසුකම් ලැබූ අතර සිංහලෙන් 157 දෙනෙක් සහ ඉංග්‍රීසියෙන් 41 ක් දෙනෙක් තෝරා ගන්නා ලදී.

තරගයට සහභාගිවන්නන් වැඩිදෙනෙක් ප්‍රේරාදෙනිය විශ්ව විද්‍යාලයෙහි. සෙසු අය අනෙක් විශ්ව විද්‍යාල වලත්, හිති විද්‍යාලයේත්, වෙනත් උසස් අධ්‍යාපන ආයතන වලත් සිසුන් ය.තරගයට සහභාගිවිය යුතු ආකාරය ගැන අවබෝධයක් ලබාදීම සඳහා සම්මන්ත්‍රණ 13 ක් අම්පාර, මඩකලපුව, කොළඹ, යාපනය, මහනුවර සහ මාතර යන නගරවල පැවැත්විණි.

මෙවර සුපිළිපන් ප්‍රණාමයට නාම යෝජනා 73ක්

ශ්‍රී ලංකාවේ දූෂණයට වරෙහිව පුරෝගාමී මෙහෙවරක නිරත වූ පුද්ගලයන් හා සංවිධාන වෙත ප්‍රණාම පිදෙන ජාතික සුපිළිපන් ප්‍රණාම 2009 සඳහා මෙවර නාමයෝජනා 73ක් ඉදිරිපත්වී තිබිණි.

ස්වාධීන විනිශ්චය මණ්ඩලයක් විසින් එම නාමයෝජනා සලකා බැලීමෙන් පසු මේ වනවිට අවසාන වටය සඳහා නාමයෝජනා 5ක් තෝරාගනු ලැබූ අතර, ඒ පිළිබඳව වැඩිදුර විමර්ශනය කිරීමෙන් අනතුරුවව ප්‍රණාමලාභීන් තෝරාගැනීමේ කරගනු සිදුකෙරුණු බවත් සුපිළිපන් ප්‍රණාම සංවිධායකයෝ පවසති.

දකුණු ආසියානු කාර්ය මණ්ඩල හුවමාරුව

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනයේ, දකුණු ආසියානු රටවල කාර්ය මණ්ඩල හුවමාරුවක් යටතේ ශ්‍රී ලංකා ඒකකයේ වැඩසටහන් කළමණාකරු ධනුෂ්න විජේසෝන් බංගලිදේශයේ ට්‍රාන්ස්පේරන්සි ඒකකයේ වසරක සේවා කාලයකට පිටත්ව ගිය අතර, එම හුවමාරුවට යටතේ ම මාලදිවයිනේ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනයේ සේවය කළ අයිමින් රමීඩ් අප ආයතනයේ සේවයට එක්වී සිටී.

රෝහල් සේවාව ඥාති හිතවතුන්ට සීමාවෙලා

සමීක්ෂණයට සහභාගී වූ 98%ක් කියති

කොළඹ දිස්ත්‍රික්කයේ රජයේ රෝහල් වල විවිධ ආකාරයේ සුළු පරිමාන දූෂණ, අල්ලස් සහ ඥාති මිතු සංගත රැසක් ක්‍රියාත්මක වන බව ට්‍රාන්ස්පෙරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය කොළඹ විශ්ව විද්‍යාලය හා එක්ව සිදුකළ අධ්‍යනයකින් හෙළිවී තිබේ.

සමීක්ෂණයට සහභාගීවූවන්ගෙන් 98.5%ක් තරම් අති බහුතරයකගේ මතය වී ඇත්තේ රජයේ රෝහලකින් යම් සේවාවක් ලබාගැනීමට හමි පුද්ගලික හැසුනුම්කමක් හෝ ඥාති මිතු සබඳතාවයක් අවශ්‍ය බවයි. එසේම රෝහල තුළ සාමාන්‍ය හිති මඟහරවා කටයුතු කිරීමට සබඳතාවයක් උපයෝගී කරගත් බව 61.2%ක් ප්‍රකාශ කර ඇති අතර තවත් 52.0%ක් පෙන්වාදී ඇත්තේ තමන්ට රෝහල් කාර්ය මණ්ඩලයට මුදල්, තෑග හෝ සංතෝෂම් ලබාදීමට සිදුවූ බවය.

රජයේ රෝහල් වල බාහිර රෝගී අංශ, ඔසුහල, පසායකාගාර, වාර්ටු අත්‍යන්තරය, මෘත ශරීරාගාරය, ඖෂධ රියන කිරීම් හා ඖෂධ සැපයුම් ප්‍රසම්පාදනය, කොන්ත්‍රාත් උපකරණ සම්පාදනය හා ඉදිකිරීම් යන ක්ෂෙත්‍ර හරහා මෙම දූෂණ පැතිරී ඇති බවත්, එහි ප්‍රතිඵලයක් ලෙස රෝගීන්ට හොම්මේල් ලැබෙන සේවා වෙනුවෙන් වීළිධ පුද්ගලයන් හා කණ්ඩායම් වෙත අතිශයින් ගෙවීම් කිරීමට සිදුවී ඇති බවත් එම සමීක්ෂණ වාර්තාව වැඩිදුරටත් පෙන්වා දෙයි.

රජයේ සෞඛ්‍ය ක්ෂෙත්‍රයේ ඇතුම්කතා සිදුවන ප්‍රධාන අංශ ලෙස, පෝලිමේ මුල් අංක ලබාගැනීමට මුදල් ගෙවීමට සිදුවීම, උපස්ථායකයන් මුදල් ලබාගෙන ඇතැම් රෝගීන්ට විශේෂ සැලකිලි කිරීම, මෘත ශරීර ලබාගැනීම සඳහා රෝහල් සේවකයන්ට මුදල් ගෙවීමට සිදුවීම, වෛද්‍යවරු ඖෂධ සම්බාධ වලින් මුදල් ලබාගෙන එම සම්බාධවල ඖෂධ රෝගීන්ට රියන කිරීම, ඖෂධ සම්බාධ දේශපාලකයන්ට සහ නිලධාරීන්ට මුදල් ගෙවා ඔවුන්ගේ ඖෂධ සැපයීම සඳහා අනුමැසිය ලබාගැනීම, ප්‍රෝඩාකාරී ලෙස කල් ඉකුත්වූ ඖෂධ වල දින වෙනස් කිරීම, හිතවත් සම්බාධ වෙත සාමාන්‍ය ක්‍රියා පටිපාටියෙන් පිට කොන්ත්‍රාත් පැවරීම, ඉහළ මිල ගනන් යොදා උපකාරණ වෙන්කිරීම වලින් ලාභ බෙදාගැනීම, ආදී ක්ෂෙත්‍ර රැසක් කෙරෙහි සමීක්ෂණ කණ්ඩායම අවධානය යොමුකර තිබේ.

මෘත ශරීරයක් හිඳහස්කර ගැනීමටත් අල්ලසක්

දුර බැහැර සිට කොළඹ රෝහල් කරා පැමිණෙන පුද්ගලයන්ට මෘත ශරීරාගාරයේ දේහයක් හිඳහස් කරගැනීමේ ක්‍රියා පටිපාටිය ගැන හිසි අවබෝධයක් නොමැතිවීම නිසා ඒ වෙනුවෙන් අල්ලස් දීමට සිදුවී ඇති බවත්, සමීක්ෂණයට සහභාගීවූවන්ගෙන් 19%ක් මෘත ශරීර හිඳහස් කරගැනීමට වලෙස අල්ලස් දී ඇති බවත් සමීක්ෂණ වාර්තාව පෙන්වා-දෙයි.

මෙම සමීක්ෂණයට සහභාගීවූවන්ගෙන් බහුතරය රෝහල් වලින් ඉටුවන සේවාව හොම්මේල් ලැබීම ගැන තෘප්තිමත් වන බවත්, අත්‍යෙන්තිමත් පත්වන්නන් පෙන්වා දෙන ප්‍රධාන කරුණු වන්නේ දිගු පෝලිම්, රෝහල් සේවකයන්ගේ අක්‍රාරණික සැලකීම් සහ ඖෂධ ඌනතා බවත් සමීක්ෂණ වාර්තාව පෙන්වාදෙයි.

ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂෙත්‍රයේ දූෂණ පිළිබඳව සිදුකෙරෙන අධ්‍යනයක කොටසක් වශයෙන් සිදුකර ඇති මෙම සමීක්ෂණය කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ, කිම්බිරිගස්යාය, කොළොන්නාව, කැස්බෑව, හෝමාගම, පාදුක්ක, හංවැල්ල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශ ආශ්‍රිතව නිවාස 200ක් ඇසුරින් සිදුකර තිබේ. මෙම වාපාසෙහිය වෙනුවෙන් මූල්‍ය අනුග්‍රහය සපයා ඇත්තේ ගෙඩේරිව් ට්‍රස්ට් පදනමයි.

සමීක්ෂණය පිළිබඳ සම්පූර්ණ වාර්තාව සඳහා අපගේ www.tisrilanka.org වෙබ් අඩවියට පිවිසෙන්න

සුපිළිපන්
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා - පුවත් හසුන | 05 වන වෙළුම | නොවැම්බර් 2009



ශ්‍රී ලංකාවේ දූෂණ තත්ත්වය ඉහළයයි

රටවල් 180 අතරින් ශ්‍රී ලංකාවට 97 වැනි ස්ථානය

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනය විසින් වාර්ෂිකව නිකුත්කරන දූෂණ සංජානන දර්ශකයට අනුව (CPI Index) 2009 වසරේදී රටවල් 180 ක් අතරින් ශ්‍රී ලංකාව 97 වැනි ස්ථානය දක්වා පහත වැටී තිබේ.

2008 වසරේදී එම දර්ශකයේ 93 වැනි ස්ථානය ශ්‍රී ලංකාවට හිමිව තිබූ අතර මෙවර ශ්‍රී ලංකාවේ ලකුණු ප්‍රමාණය 3.1 දක්වා පහත බසිමින් එම ස්ථානය තවත් ස්ථාන හතරකින් පහත බැස තිබේ.

ලෝකයේ රටවල රාජ්‍ය හිලධාරීන් අතර මෙන්ම දේශපාලඥයින් අතර පවත්නා දූෂණ මට්ටම සංජානනය වන ප්‍රමාණය (දැනෙන ප්‍රමාණය) පිළිබඳ සමීක්ෂණ මගින් දත්ත රැස්කරමින් මෙම දර්ශකය සැකසෙන අතර ඒ යටතේ රටක් අන්තර දූෂිත නම් ලකුණු 0 ක්ද මුළුමනින්ම දූෂණයෙන් තොරනම් ලකුණු 10 ක් වශයෙන් ලකුණු ලබාදීමේ සිදුකෙරේ.

ශ්‍රී ලංකාව ප්‍රථම වරට මෙම දර්ශකයට ඇතුලත් වූයේ 2002 වර්ෂයේදීය. එම වසරේ ලකුණු 3.7 ක් ලබාගනිමින් සමීක්ෂණයට සහභාගී වූ රටවල් 102 අතර ශ්‍රී ලංකාවට 52 වැනි ස්ථානය හිමිවූ අතර ඉන්පසු වසරක් පාසා ශ්‍රී ලංකාව එම දර්ශකයේ පහතට වැටී තිබේ.

මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ විධායක අධ්‍යක්ෂ ජේ.සී. වැලිඅමුණ මහතා පෙන්වා දෙන්නේ මෙයින් පැහැදිලි වෙද්දැනෝවක් ශ්‍රී ලංකාව වෙත එල්ලේ තිබෙන බවයි. එබැවින් මෙරටින් දූෂණය වහා තුරන් කිරීමට ඉක්මන්, සාමූහික හා සම්පූර්ණ වෙනසක් ඇති කිරීමට වහා පියවර ගත යුතුව ඇතැයි වැලිඅමුණ මහතා පෙන්වා දෙයි.

මෙම දර්ශකය හරහා ශ්‍රී ලංකාවට අත්ව තිබෙන ප්‍රතිඵලයෙන් ඉගෙන ගත යුතු හොඳම පාඩම වන්නේ දුසැරිය අවම කරලීමේ ජාතික වැඩපිළිවෙලක අවශ්‍යතාවය බවද හෙතෙම සඳහන් කළේය.

ඒකාධිපති පාලනයන් පවතින හා ජාත්‍යන්තරව අර්බුදයන්හි පැටලී සිටින රටවල යහපාලනය ඉතා පහල මට්ටමක පවතින බැවින් එම රටවල් දූෂණ සංජානන දර්ශකයේ අවම ස්ථාන හිමිකරගෙන තිබෙන බවද වැලිඅමුණ මහතා පෙන්වා දුන්හේය.

දකුණු ආසියානු රටවල් අතුරින් භූතානය (5) සහ ඉන්දියාව (3.4) පමණක් ශ්‍රී ලංකාවට ඉදිරියෙන් සිටින අතර මාලදිවයින (2.5) පාකිස්ථානය (2.4) සහ නේපාලය (2.3) ශ්‍රී ලංකාවට පහලින් පසුවේ.

මෙම වසරේ දූෂණ සංජානන දර්ශකයේ ඉහළම ස්ථානය හිමිකරගෙන සිටින්නේ නවසීලන්තයයි. (9.4) ආසියාතික රටක් වන සිංගප්පූරුව (9.2) සහ ස්වීඩනය (9.2) දෙවන ස්ථානයට පත්ව සිටින අතර ලකුණු 9 ලබාගනිමින් ස්විට්සර්ලන්තය තෙවන ස්ථානය සනිකරගෙන සිටී. එමඟින් එම රටවල දීර්ඝ කාලීනව පවතින දේශපාලනික ස්ථාවරය, අර්බුදයන්හි අවම බව, හිති හිසියාකරව ක්‍රියාත්මක වීම මෙන්ම රාජ්‍ය ආයතනයන්හි හිසි ක්‍රියාකාරීත්වයද පෙන්නුම් කෙරේ.

මෙම දර්ශකයේ සෝමාලියාව (1.1) ඇෆ්ගනිස්ථානය (1.3) මියන්මාරය (1.4) සුඩානය සහ ඉරාකය (1.5) පහළම ස්ථාන හිමිකරගෙන සිටී. මෙම ප්‍රතිඵලය මගින් දර්ශකයේ අවසන් ස්ථාන හිමිකර ගෙන සිටින රටවල පවත්නා දීර්ඝ කාලීන අර්බුද හේතුවෙන් එම රටවල පරිපාලන ව්‍යුහයේ බිඳවැටීම පැහැදිලි වෙයි.

දෙවැනි පිටුවට . . . . . .

ලක්ෂ ගණනින් මුදල් ගෙවා නොමිලේ අධ්‍යාපනය ලැබීම
03 පිටුව

රෝහල් සේවාව ඥාති හිතවතුන්ට සීමාවෙලා
06 පිටුව

සුපිළිපන්
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා
28/1, බුලර්ස් පදමන, කොළඹ 07
දුරකථනය - 011 2501474 ෆැක්ස් - 011 2592287 විදුහුන් තැපැල් - tisl@tisrilanka.org වෙබ් අඩවිය - www.tisrilanka.org

ගෙනේඩ් ප්‍රහාරයට වසරයි

වසරක් ගත වී ඇතත් වගකිවයුත්තන් නිහඬයි

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ විධායක අධ්‍යක්ෂ ජේ.සී. වැලිඅමුණ මහතාගේ නිවසට ගෙනේඩ් ප්‍රහාරයක් වල්ල වී මේ වන විට වසරක කාලයක් ගත වී ඇතත් ඒ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා රට වගකිවයුත්තන් නිතිය ඉදිරියට පැමිණවීමට රජය අපොහොසත්ව තිබේ.

වැලිඅමුණ මහතාගේ නිවසට මෙම ප්‍රහාරය වල්ලවූයේ පසුගිය වසරේ සැප්තැම්බර් 27 වනදා රාත්‍රී 11. 40 ට මණ්ඩය.

මෙම ප්‍රහාරය සිවිල් සමාජය තුළ විශාල ආන්දෝලනයක් ඇතිකළ අතර වාතතිය සංගම් ඇතුළු සංවිධාන සිය ගණනක ප්‍රබල ඉල්ලීම් වූයේ රට අදාල වගකිවයුත්තන් නිතිය ඉදිරියට පමුණුවන ලෙසය.

ප්‍රහාරය වල්ල කළ පුද්ගලයන් කවුරුන්දැයි මෙතෙක් අනාවරණය කර ගැනීමට පොලිසිය අපොහොසත්ව ඇතත් ශ්‍රී ලංකාව තුළ දැසැරියට වරගේව හා හිමිකම් ආරක්ෂා කිරීම වෙනුවෙන් වැලිඅමුණ මහතා සිදුකරනු ලබන ක්‍රියාමාර්ගවලට එරෙහි පුද්ගලයන් පිරිසක් මෙම ප්‍රහාරය වල්ල කරන්නට ඇතැයි සිවිල් සංවිධානවල මතය වී තිබේ.

මෙම සිද්ධිය පිළිබඳව පවත්වනු ලබන පරීක්ෂණ පිළිබඳව ඉතා විමසිලිමත්ව සිටින ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය, වසරක් ගතවන තෙක් ප්‍රතිඵලයක් අත්වි නැතත්, දැඩිරි කාලය තුලදී හෝ විනිවිද හා සාධාරණ පරීක්ෂණයක් සිදුකරනු ඇතැයි අපේක්ෂා කරයි.

මානව හිමිකම් ක්‍රියාකාරීන් හා මාධ්‍යවේදීන්ට ද වරගේව අභණ්ඩව වල්ලවන බලපෑම් පිළිබඳව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය දැඩි අවධානයෙන් පසු වෙයි. මෙවන් ප්‍රහාර හා බලපෑම් ශ්‍රී ලංකිකයන්ගේ අදහස් පළකිරීමට ඇති අයිතිය හා හාද සාක්ෂියට එකඟව ක්‍රියා කිරීමට ඇති අයිතිය මැඩ පැවැත්වීමට ගනු ලබන උත්සාහයන් බව අපගේ විශ්වාසය වී තිබේ.

පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශ 35 ක් සූදනම්

එක් එක් අමාත්‍යාංශය මගින් ඉටු කරන කාර්යයන් පිළිබඳව වගකීම දැරීම සඳහා වන පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශය 34 ක් මේ වන විට පියවර ගෙන තිබේ.

මහජනතාවට සපයන සේවාවන් විධිමත් හා කාර්යක්ෂම කිරීම සඳහා පුරවැසි ප්‍රඥප්තිමින් ක්‍රියාත්මක කරන ලෙස ඇමති මණ්ඩලය සියළුම අමාත්‍යාංශ වලට නියෝග කර ඇත.

එම නියෝගයට අනුව දැනටමත් අමාත්‍යාංශ 35 ක් පුරවැසි ප්‍රඥප්තිමින් සකස් කර අවසන් බවත් එම ප්‍රඥප්තිමින් ලබන වසර මුල සිට ක්‍රියාත්මක කළ හැකි වන බවත් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ඩී. දසනායක මහතා පැවසීය.

එම පුරවැසි ප්‍රඥප්තිමින් මගින් අදාල අමාත්‍යාංශය ජනතාවට ලබාදෙන සේවාවන්, එම සේවාවන් ලබාදීමට තනිවන කාලසීමාව, අදාල සේවාවන් සඳහා අය කෙරෙන ගාස්තු ආදී සියලු තොරතුරු ප්‍රසිද්ධ කෙරේ. මෙම පුරවැසි ප්‍රඥප්තිමින් අමාත්‍යාංශය වෙත පැමිණෙන සියළුවදෙනාගේම දැනගැනීම සඳහා අමාත්‍යාංශය ඉදිරිපත සුදුරිශනය කළ යුතුය.

දැනටමත් ඉවයිහා පුරා පිහිටි සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කෙරේ.

"අපිට අවශ්‍යයි ජනතාවට කියන්න ඔවුන්ට අයිතියක් තිබෙන බව. එක් එක් රාජ්‍ය ආයතනයෙන් තම රාජකාරිය ඉටුකරගන්න, ඒ වගේම ඒ සේවාව ඒරගවත්ව හා කාර්යක්ෂමව ලබාගැනීමේ අයිතියක් ජනතාවට තිබෙනවා" දසනායක මහතා කීවේය. පුරවැසි ප්‍රඥප්තිය හිතිකක් බවට පත්කර ගැනීම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ඊළඟ වැසය බවත් එමඟින් සේවාවන් හිසි ලෙස ඉටු කොකරන රස්සේ ආයතනවලට වරෙහිව හිතිය ඉදිරියට යාමේ අවස්ථාව සාමාන්‍ය ජනතාව වෙත හිමිවන බවත් ලේකම්වරයා පැවසීය.

අමාත්‍යාංශ ලේකම් ඩී දසනායක මහතා දූෂණයට වරෙහි රාජ්‍ය සේවකයින්ගේ එකතුව වන "සුපිරිසිදු දෑත්" හි ප්‍රධානියා වශයෙන් ද කටයුතු කරයි.

ශ්‍රී ලංකාවේ දූෂණ තත්ත්වය ඉහළයයි. . . .(මුල් පිටුවෙන්)



හියුගෝ ලබෙල්ලා මහත්මිය

දූෂණ සංජානන දර්ශකය නිකුත් කරමින් හිඳේදෙනෙක් නිකුත් කරන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනයේ සභාපතිනී හියුගෝලී ලබෙල්ලා මහත්මිය පවසන්නේ දුසැරිය අවම කරලීම සඳහා, ශක්තිමත් පාර්ලිමේන්තු ක්‍රියාදමයක්, ස්වාධීන අධිකරණ සේවාවක්, හිදහස් සහ හිසි පහසුකම්වලින් සමන්විත වීගණන විගුහයක් දූෂණ මර්දන ආයතන, හිති හිසි ලෙස ක්‍රියාත්මක කිරීම හා මහජන මුදල් වල විනිවිදභාවය අත්‍යවශ්‍ය වන බවයි.



ලක්ෂ ගණනින් මුදල් ගෙවා නොමිලේ අධ්‍යාපනය ලැබීම

"මට දැන්දෙවෝ දෙන්නෙක් ඉන්නවා. හැසෙමින් කන්න හැටියට සාධාරණ විතර හැදෙනවා ලොකු දැරුවා ගොනු ඉස්කෝලෙකට යාන්න සැහෙන උත්සාහයක් ගන්නා. ඒත් අපාර්ථක වුණා. අන්තිමට දැරුවා දැන්න වුණේ ලක්ෂ 1 1/2 ක් විතර දීලා පුද්ගලික ඉස්කෝලෙකට. වාපාසෙක රු. 15,000/- ක් විතර ගොඩලා, වසර වලටත් ගොවිතෙක, අපෙක්ක දැරුවන් පුද්ගලික ඉස්කෝලෙකට යවාගන්න මට අමාරුයි. ඒ නිසා පුහාන් ආණ්ඩුවේ ගොනු ඉස්කෝලෙකට දාගන්න සැහෙන උත්සාහයක් ගන්නා. ඒ වෙනුවෙන් දැනට ප්‍රියාත්මකවන හැඩ ගොනු. - හත්ක ක්‍රමවේදයක්ම මා ගොඩදාන් අධ්‍යයනය කළා"

පෙදේශලික ආංශයේ විධායක හිලධාරියෙකු වන **සමිදු** දැඩි පරිශ්‍රමයක් දරා තමන් වක්රැස් කරගත් තොරතුරු නොපැකිළව අපවෙත ඉදිරිපත් කරමින් සිටා සිටියේය.

"මෙහෙ පුදුවක් වගේ වැඩක්. යමහන් විට දිනකට, යමහන් විට වැඩෙන් කෙනෙන්නෙත් නෑ දිදු යැල්ලක් නෑ" මේ ගණුදෙනුවේ ඉන්න බොහෝ දෙනෙක් මුලදීම වැඩෙවිය යන ගාණ කියනවා. වැඩෙන් හම්බෙන්නා පස්සේ ගණුදෙනු ගැන මලාපහිලි කියල